# ගණිතය කාර්ය පත්‍රිකාව

10 ශ්‍රේණිය ගණිතය නොවැම්බර් 02 සතිය

30. පෘෂ්ඨ වර්ගඵලය හා පරිමාව තේමාව - මිනුම්

**මෙම සතිය තුළ නියමිත පාඩම් වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵල**

- අරය r ද , උස h ද වූ ඍජු වෘත්ත සිලින්ඩරයක පෘෂ්ඨ වර්ගඵලය A සඳහා $A = 2\pi r^2 + 2\pi rh$ සූත්‍රය ගොඩනගයි.
- එම සූත්‍රය භාවිතයෙන් ඍජු වෘත්ත සිලින්ඩරයක පෘෂ්ඨ වර්ගඵලය ගණනය කරයි. ගැටළු විසඳයි.
- අරය r ද , උස h ද වූ ඍජු වෘත්ත සිලින්ඩරයක පරිමාව V සඳහා $V = \pi r^2 h$ සූත්‍රය ගොඩනගයි.
- එම සූත්‍රය භාවිතයෙන් ඍජු වෘත්ත සිලින්ඩරයක පරිමාව ගණනය කරයි. ගැටළු විසඳයි.
- හරස්කඩ වර්ගඵලය A ද , උස h ද වූ ඍජු ප්‍රිස්මයක පරිමාව V සඳහා $V = Ah$ සූත්‍රය ගොඩනගයි.
- එම සූත්‍රය භාවිතයෙන් ඍජු ප්‍රිස්මයක පරිමාව ගණනය කරයි. ගැටළු විසඳයි.

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් කෙටියෙන්**

- පෙර ඉගෙනුම් කාර්ය පත්‍රිකාවල ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරමින් ඉගෙන ගන්න
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ නිදසුන් අධ්‍යයනය කරමින් ක්‍රියාකාරකම්වල නිරත වන්න
- ගණිතය ii - පෙළ පොතේ 128 පිටුවේ 29.1 අභ්‍යාසය සම්පූර්ණ කරන්න
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ පළමු කොටස අධ්‍යයනය කර 29.2 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ 2වැනි කොටස අධ්‍යනාය කර 29.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ 3වැනි කොටස අධ්‍යනාය කර 29.4 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ 4වැනි කොටස අධ්‍යනාය කර 29.5 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- පෙළ පොතේ මිශ්‍ර අභ්‍යාසය සම්පූර්ණ කරන්න. මෙම පත්‍රිකාවේ පසු පිටෙහි ඇති ඒකක පරීක්ෂණය සම්පූර්ණ කරන්න.
- e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, youtube නාලිකා, පාසල් ශිෂ්‍ය සමූහ (Whatsapp, Viber, …) Google class room, online ඉගෙනුම්, පාසල් වෙබ් අඩවි, පෙළ පොත හෝ මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, website LMS පාඩම් වෙනත් ආධාරක**

- 10 ශ්‍රේණිය ගණිතය ii පෙළ පෙතේ පිටු අංක 124 සිට 138 දක්වා
- ගණිතය පහසුවෙන් - මිනුම් - ජාතික අධ්‍යාපන ආයතනය (පිටු අංක 53 හා 56)
- ගණිත ගුරයා ග්‍රන්ථය - ගණිත ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය (පිටු අංක 83 සිට 102 දක්වා )
- E - නැණ පියස වෙබ් අඩවිය
- ‘සතුටින් ගණිතය’ සබරගමු පළාත් 10 ශ්‍රේණිය *Telegram* සිසු සමූහය
- https://t.me/joinchat/e7B47qD7E-Q3ZDI1
- e නැණ පියස වෙබ් අඩවිය - සබරගමු පළාත, සතුටින් ගණිතය ඉගෙනුම් ගොනුව (PDF),
- පෙර ඉගෙනුම් කාර්ය පත්‍රිකා/ ස්වයං අධ්‍යයන කට්ටලය/ ඒකක පරීක්ෂණය
- https://www.enenapiyasa.lk/lms/course/view.php?id=108#section-28
- E - තක්සලාව වෙබ් අඩවිය
- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=537&section=32

ගුරු ගෙදර නාලිකාව -
වෙනත් Youtube link -

**ඒකක පරීක්ෂණය - සම්භාවිතාව**

**(01) 1 සිට 6 තෙක් අංක යෙදූ දාදුකැටයක් එක වරක් උඩ දැම්මේ අහඹු පරීක්ෂණයේ**

i) **නියැදි අවකාශය ලියන්න**

(ii) සරල සිද්ධි දෙකක් ලියන්න

(iii) සංයුක්ත සිද්ධි දෙකක් ලියන්න

(02) 1 සිට 4 තෙක් අංක යෙදූ චතුස්තල දාදුකැටයක් එක වරක් උඩ දැමීමේ අහඹු පරීක්ෂණයේ

(i) නියැදි අවකාශය ලියන්න

(ii) පහත සිද්ධි අවයව සහිතව ලියන්න

(a) A={වර්ග සංඛ්‍යා}

(b) B={ප්‍රථමක සංඛ්‍යා}

(c) C={ ත්‍රිකෝණ සංඛ්‍යා}

(d) D={ ඔත්තේ සංඛ්‍යා}

(e) E={ ඉරට්ට සංඛ්‍යා}

අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර සිද්ධි යුගල තෝරන්න.

(03) 1 සිට 5 තෙක් අංක ලියන ලද එකම තරමේ බෝල 5කින් අහඹු ලෙස එක බෝලයක් ඉවතට ගැනීමේ සසම්භාවී පරීක්ෂණයේ

1. නියැදි අවකාශය සොයන්න.
2. A යනු ඔත්තේ සංඛ්‍යාවකි A කුලකය අවයව සහිතව ලියන්න.
3. A' සිද්ධිය අවයව සහිතව ලියන්න
4. n(A) සොයන්න.
5. p (A) සොයන්න.

(04) 1 සිට 4 තෙක් අංක යෙදූ චතුස්තල දාදු කැට 2ක් එකවර උඩ දැමීමේ අහඹු පරීක්ෂණය නියැදි අවකාශය කොටු දැලක දක්වන්න.

1) දාදුකැට 2හිම එකම අගයක් ලැබීමේ සිද්ධිය වටකර A ලෙස නම් කරන්න.
2) n(A) කීයද?
3) දාදු කැට දෙකෙහිම ප්‍රථමක සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

( 05) මල්ලක ඇති එකම තරමේ රතු බෝල 3ක් හා නිල් බෝල 2ක් අතරින් අහඹු ලෙස එක බෝලයක් ඉවතට ගෙන ලැබුණ වර්ණය සටහන් කොට එය ආපසු දමා තවත් බෝලයක් ඉවතට ගනු ලැබේ.

1) මෙම අහඹු පරීක්ෂණයේ නියැදි අවකාශය රූප සටහනක දක්වන්න.
2) ලබා ගත් බෝල 2ම රතු පාට වීමේ සම්භාවිතාව සොයන්න.
3) ලබා ගත් බෝල 2ම එකම වර්ණයෙන් යුතු එවා වීමේ සම්භාවිතාව සොයන්න.

එම් ඒ සී එස් බණ්ඩාර - සීහෝත් ක වි. - යටියන්තොට